# 10

## ධාතූන් වහන්සේලා හැඳින ගැනීමට ඒවායේ යම්කිසි ප්‍රාතිහාර්‍ය්‍ය දක්වීමක් ඇත්තේ ද?

ධාතූන් වහන්සේලාය කියන්නේ පිරිනිවන් පා වදාළ තථාගතයන් වහන්සේ ගේ ශ්‍රී දේහය ආදහන කිරීමෙන් පසු නො දැවී ඉතුරු වූ කොටස්වලට ය. ඒවාට ධාතුය කියන්නේ දනීමක් නැති නිසාය. සත්ත්ව පුද්ගල භාවයක් නැති නිසා ය. සත්ත්ව පුද්ගල භාවයක් නැති ඒ ධාතූන්ට ප්‍රාතිහාර්‍ය්‍ය දක්වීමේ අදහසක් හෝ උත්සාහයක් කවදවත් ඇති නො වේ. එබැවින් ධාතූන් වහන්සේලා විසින් ප්‍රාතිහාර්‍ය්‍ය දක්වීමක් නො කරන බව කිව යුතු ය. බුදුන් වහන්සේ විසින් උන් වහන්සේ ගේ ඍද්ධිබලයෙන් මේ ධාතූන් වහන්සේලා සම්බන්ධයෙන් යම් කිසි ප්‍රාතිහාර්‍ය්‍යයක් වේවායි අධිෂ්ඨාන කොට තුබුණහොත් ඒ දේ සිදුවිය හැකි ය. මිනිසුන් ගේ ශ්‍රද්ධාව දියුණු කිරීම පිණිස සමහර විට දෙවියන් විසින් ධාතූන් ගේ ප්‍රාතිහාර්‍ය්‍ය දක්විය හැකි ය. බලවත් සැදැහැවතුන් ගේ අධිෂ්ඨාන - සත්‍යක්‍රියාවලින් ද සමහර විට ප්‍රාතිහාර්‍ය්‍ය සිදුවිය හැකි ය.